# 2025 ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීම වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව
දිනය - 2025.10.24
වේලාව - පෙ.ව. 10.00
පැමිණීම

| | නම | | තනතුර |
|---|---|---|---|
| I. | එච්.එල්.ජයසිරි | - | ගරු සභාපති |
| II. | ආර්.රජිත් ප්‍රියදර්ශන | - | ගරු උපසභාපති |
| III. | හර්ෂ උදයකුමාර ජයවීර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IV. | ආර්.කේ.එම්.රෝහිත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| V. | එම්.එල්.එම්.හනීෆා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VI. | කේ.රත්න | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VII. | එම්.ඒ.ආරියසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| VIII. | එන්.ටී.චමින්ද ජයනාත් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| IX. | පී.එම්.පී.අනුර ප්‍රියන්ත | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| X. | එම්.එල්.එම්.අසාර් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XI. | බී.කේ.නිලූකා කුමුදුනී | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XII. | ආර්.ඩබ්ලිව්.සිරිසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIII. | කේ.ජී.තමිලා දිල්රුක්ෂි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIV. | සුදත් චමින්ද උයනහේවා | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XV. | එස්.දයාසේන | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVI. | එල්.වයි.නුවන් චතුරංග | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVII. | ජේ.ඒ.තනුජා දිලානි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XVIII. | උදානි ලියනගේ | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XIX. | එල්.ඒ.සුනිල් පියංකර | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XX. | ඩබ්ලිව්.පී.සුජීවා නිල්මිණි | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| XXI. | එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

නොපැමිණීම :- ---

| | නම | | තනතුර |
|---|---|---|---|
| XXII. | බී.ඩී.නිපුන ගයාශාන් | - | ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව,ගරු සභාපති , එච්.එල්.ජයසිරි මහතා විසින් 2025 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික සභාව පැවැත්වෙන අද දින පැමිණ සිටින ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්,ලේකම්තුමිය හා මාධ්‍යවේදී රුක්මන් රත්නායක මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.



CamScanner

(අ) 2025.09.25 වන දින පවත්වන ලද මහ සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.

2025.09.25 වන දිනැති මහ සභා වාර් තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන බව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා යෝජනා කළ අතර , එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.

(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත
(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන -නැත
(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත
(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.

- <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

- <u>මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>

1. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම තනි මහල් වෙළඳ සංකීර්ණයේ සියළු කඩ කාමර වල හා දෙමහල් වෙළඳ සංකීර්ණයේ 01 සිට 13දක්වා කඩ කාමර වල වර්ගඵලය වෙනස් වීම නිසා නව නව තක්සේරුව ලබාගැනීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම තනි මහල් වෙළඳ සංකීර්ණයේ සියළු කඩ කාමර වල හා දෙමහල් වෙළඳ සංකීර්ණයේ 01 සිට 13දක්වා කඩ කාමර වල කොරිඩෝව ආවරණය කර ඉදිකිරීම් සිදු කර ඇත .ඒ හේතුව නිසා කඩ කාමරයේ පැවති වර්ගඵලය විශාල වශයෙන් වෙනස් වී ඇති අතර දීර්ඝ කාලයක සිට බදුකරුවන් මෙම කොටස් භුක්ති විඳිමින් සිටී .මෙම වෙනස් කිරීම් මීට වසර ගණනාවකට පෙර සිදු කළ ඒවා වන අතර එම කොටස් කඩා ඉවත් කිරීමේ දී ප්‍රායොගික ගැටළු පැන නැගිය හැකි බැවින් එම කොටස් ද ඇතුළත් කර නව තක්සේරුව ලබා ගැනීමට 2025.10.07වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී තීරණය වූ බැවින්, ඒ ආකාරයට නව තක්සේරුව ලබාගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි .
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

2. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු යෝධකණ්ඩිය පොදු වෙළඳපොළ භූමියේ පිහිටි අංක 02 කඩ කාමරය හා අංක 08කඩ කාමර දෙකෙහි මාසික බිල් කිරීම නතර කිරීම සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු යෝධකණ්ඩිය පොදු වෙළඳපොළ භූමියේ පිහිටි අංක 02 කඩ කාමරය හා අංක 08කඩ කාමරය දැනට අබලන් තත්ත්වයේ පවතී.එම කඩ කාමර දෙකෙහි මාසික බිල් කිරීම නතර කිරීමට 2025.10.07වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේදී තීරණය වූ බැවින් එම කඩ කාමර දෙකෙහි මාසික බිල් කිරීම නතර කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි .

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජ්.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.



CamScanner

3. **තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කාර්යයන් සඳහා දරන ලද රු.100,000.00 වැඩි වැය කිරීම සඳහා ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව**

2025-10-07 දිනැති පැවති මුදල් කමිටු සඳහා ඉදිරිපත් කරන ලද රු.100,000.00 ට වැඩි ගෙවීම් සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ආයතනය | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 01 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | බවුසර් සැපයුම් සඳහා ජලය ලබාදීම වෙනුවෙන් 2025 අගෝස්තු මස බිල්පත් පියවීම | 171,572.00 |
| 02 | එල්.එච්.එස්.පී. කුමාර | සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා කෑම පාර්සල් ලබා දීම (2025 අගෝස්තු මස) | 102,240.00 |
| 03 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | බවුසර් සැපයුම් සඳහා ජලය ලබාදීම වෙනුවෙන් 2025 අගෝස්තු මස බිල්පත් පියවීම | 166,026.00 |
| 04 | සෝමසිරි ස්ටෝර්ස් | ආදාහනාගාරය සඳහා ගෑස් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 160,316.97 |
| 05 | ලේකම් | දෛනික රාජකාරි කටයුතු සඳහා යොදාගන්නා සේවකයින්ට ගෙවීම - අගෝස්තු මස | 651,250.00 |
| 06 | මෙට්රෝ කම්පියුටර් ටෙක්නොලජීස් | කාර්යාලය සඳහා ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 210,000.00 |
| 07 | ලේකම් | යාන්ත්‍රික වැඩපලේ කාර්යයන් සිදු කිරීම සඳහා පිටතින් ලබාගත් සේවකයින් සඳහා ගෙවීම | 155,950.00 |
| 08 | වී.කේ. ඔයිල් මාර්ට් | ලීටර් 210 කැල්ටෙක්ස් ඔයිල් බැරල් 01 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 229,500.00 |
| 09 | සරද එන්ටර්ප්‍රයිසස් | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා තීන්ත මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 121,370.00 |
| 10 | මුතුමාල බුක් ෂොප් | පිටු 120 CR පොත් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 237,800.00 |
| 11 | ඉරේෂා පිලිං සෙන්ටර් | ඉන්ධන බිල්පත් පියවීම | 585,479.50 |
| 12 | සුරංග හාඩ්වෙයාර් | අංක 03 වේලරය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 162,425.00 |
| 13 | දක්ෂිණ ටයර් වර්ක්ස් | කසල ටේලර් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 137,660.00 |
| 14 | තිලිණ මෝටර්ස් | 56-1099 කැබ් රථය එන්ජිම සමඟ අනෙකුත් අළුත්වැඩියාවන් වෙනුවෙන් ගෙවීම | 476,500.00 |
| 15 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | තිස්සමහාරාම බහු කාර්ය ගොඩනැගිල්ලේ ජලනල මාර්ගය දීර්ඝ කිරීම සඳහා ගෙවීම | 286,493.08 |



CamScanner

| | | | |
|---|---|---|---|
| ආවරණ අනුමැතිය යටතේ සිදු කරන ලද ගෙවීම | | | |
| 16 | ඉරේෂා ෆිලිං ස්ටේෂන් | ඉන්ධන බිල්පත් පියවීම | 1,719,595.50 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

4. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂය සඳහා වෙළඳ බදු අය කිරිම සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152(I) වගන්ති ප්‍රකාරව, සභාව විසින් පිළිගන්නට හෝ සම්මත කර ගන්නට යෙදුණ අතුරු ව්‍යවස්ථාවකින් පාලනය වන බලපත්‍රයට යටත් නොවන්නා වූ හා එම පනතේම 150 වගන්තිය යටතේ වූ කර්මාන්ත බද්දකට යටත් නොවන්නා වූ ස්ථාන හැර, අනෙකුත් උපලේඛන අංක 1 හි නිරූපිත ව්‍යාපාර වෙනුවෙන් පෙර වර්ෂය සඳහා වූ වෙළඳ ව්‍යාපාරයේ ආදායම අනුව පනතේ දැක්වෙන අනුප්‍රමාණ නොඉක්මවන්නාවූ අනුප්‍රමාණයන්ට අනුකූලව පහත උපලේඛන අංක 1 හි දක්වා ඇති ප්‍රමාණයට 2026 ව සඳහා වෙළඳ බදු වශයෙන් අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි .

උප ලේඛන 01 -

| අනු අංකය | බදු ස්වභාවය | වාර්ෂික වටිනාකම රු: 6000.00 ඉක්මවන එහෙත් රු. 12,000.00 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු:12,000.00 ඉක්මවන එහෙත් රු. 18,750.00 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු:18,750.00 ඉක්මවන එහෙත් රු. 75,000.00 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු:75,000.00 ඉක්මවන එහෙත් රු. 150,000.00 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු:150,000.00 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|---|---|
| 01 | සිල්ලර බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 02 | ගෘහ භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 03 | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 04 | පාසල් උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 05 | පිත්තල බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |



CamScanner

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 06 | ඇලුමිණියම් බඩු හා ප්ලාස්ටික් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 07 | ඔරලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 08 | ලී බඩු වෙළඳ සැළක් හෝ ලී අලෙවි සැලක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 09 | පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 10 | ග්‍රොසරියක් / සුපර් මාර්කට් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 11 | යකඩ බඩු විකිණීමේ ස්ථානයත් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 12 | පාවිච්චි කරන ලද ඇඳුම් ගබඩා කර තබා ගැනීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 13 | රෙදි පිළි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 14 | රෙකෝඩ් බාර් එකක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 15 | මෝටර් රථ, පාපැදි හෝ වෙනත් රථ වාහන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 16 | සිංහල බෙහෙත් අලෙවි කිරීමේ හෝ ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 17 | ඉංග්‍රිසි බෙහෙත් අළෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 18 | මුදල් අය කරමින් පවත්වනු ලබන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |



CS CamScanner

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 19 | දුම්වැටි වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 20 | මැටි භාණ්ඩ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 21 | බුලත් පුවක් දුම්කොළ වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 22 | විදුලි උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 23 | මත් පැන් හා රට බීම වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 24 | දුරකථන අලෙවි කිරීමේ හා අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 25 | පැළ තවානක් පවත්වාගෙන යාම හා විසිතුරු පැළ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 26 | ක්ෂණික ජායා පිටපත් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 27 | පෞද්ගලික දුරකථන ව්‍යාපාරයක් (කොමියුනිකේෂන්) පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 28 | මසා නිම කළ ඇඳුම් (නිමි ඇඳුම්) විකිණීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 29 | ගිත පටිගත කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 30 | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 31 | ලිපි ද්‍රව්‍ය රබර් සීල් කැපීම හා රථ වාහන තහඩු පෑස්වීම කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 32 | විදේශ රැකියා ඒජන්සියක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 33 | ක්‍රීඩා හා සමාජ ශාලාවක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 34 | බ්ලොක් ගල් , මල් පෝච්චි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 35 | ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 36 | ටයර් ටියුබ් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 37 | දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 38 | උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයන් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 39 | වාහන විකුණුම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 40 | තීන්ත වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 41 | පාපැදි ත්‍රීවිල් යතුරුපැදි අමතර කොටස් හා අනෙකුත් රථ වාහන අමතර කොටස් වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 42 | ස්වර්ණාභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 43 | කෘෂි රසායනික ද්‍රව්‍ය හා පොහොර අලෙවි කරන ස්ථානයන් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 44 | බැංකු සේවා (මූල්‍ය ආයතන) පවත්වාගෙන | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |



CamScanner

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | යාම | | | | | |
| 45 | ස්වයංක්‍රීය වෙලර් යන්ත්‍ර පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 46 | උකස් සේවා සපයන ස්ථාන පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 47 | කල්බදු සේවා සපයන ස්ථාන පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 48 | විසිතුරු මසුන් අලෙවි කිරීමේ හා සත්ව ආහාර ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 49 | ඩිපිවල් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 50 | විසිතුරු භාණ්ඩ, කොස්මැටික්ස් ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 51 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 52 | දුරකථන ජල පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 53 | ඉරිඟු අලෙවි කිරීමේ ස්ථාන පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 54 | විදුරු අලෙවිසැල් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 55 | පරිගනක පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 56 | කායවර්ධන පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 57 | සංගීත භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 58 | රේස් මට්ටු හල් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |



CamScanner

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 59 | ඡායාරූප ගැනීම හා ඡායාරූප මුද්‍රණ ආයතනයක් ( ස්ටුඩියෝ) පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 60 | උපකාරක පංති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 61 | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 62 | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම. | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 63 | ලිහිසි තෙල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 64 | ප්‍රවාහන පහසුකම් සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 65 | විදුලි උපකරණ අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 66 | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 67 | පුවත්පත් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 68 | ජෝතිශ්‍යය ආයතනයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 69 | යන්ත්‍රෝපකරණ හා මෝටර් රථ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 70 | බ්‍රෝකර් ස්ථාන පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 71 | පෙරමික් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 72 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 73 | සහල් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 74 | ළදරු නිෂ්පාදන අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 75 | වෙනත් විවිධ ව්‍යාපාර පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 76 | දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 77 | පානීය ජලය අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 78 | අලෙවි නියෝජිත මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 79 | වෛද්‍ය මධ්‍යස්ථානයක් හෝ වෛද්‍ය රසායනාගාර පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1,200.00 | 3,000.00 |
| 80 | සම්භාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1200.00 | 3000.00 |
| 81 | එළවළු, පලතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1200.00 | 3000.00 |
| 82 | පෞද්ගලික තක්සේරු වාර්තා ලබා දෙන ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1200.00 | 3000.00 |
| 83 | ක්‍රීඩා උපකරණ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 90.00 | 180.00 | 360.00 | 1200.00 | 3000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

5. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂය සඳහා ව්‍යාපාර බලපත්‍ර අය කිරීම සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147(1) වගන්තිය යටතේ ලැබී ඇති බලය අනුව එම පනතේම 149 වගන්තිය ප්‍රකාරව හා මෙම සභාව විසින් 2017.10.04 දින තීරණ අංක 234 යටතේ පිළිගෙන 2017.06.09 දිනැති අංක 2023 ගැසට් පත්‍රය මගින් පිළිගන්නට යෙදුණු 1952 අංක 06 දරණ (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ I වන උප වගන්තිය ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් සාදා ඇති අතුරු ව්‍යවස්ථා මාලාවන්ට යටත්ව සහ අතිවිශේෂ ගැසට්පත් අංක



CamScanner

570/7 දරණ 1988.08.23 දිනැති ගැසට් පත්‍රය මගින් පළ කෙරෙන්නට යෙදුණු සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වන අතුරු ව්‍යවස්ථාවේ නිරූපිත ස්ථාන වෙනුවෙන්, එම ස්ථානයන්හි පහත සඳහන් කරුණු මත 2026 වර්ෂය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමටත්, ඒ සඳහා පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි .

(අ) ස්ථානයේ වාර්ෂික වටිනාකම.
(ආ)ඒ වෙළඳ ව්‍යාපාරයේ පිරිවැටුම.
(ඇ)ඒ වෙළඳ ව්‍යාපාරයෙන් උපයනු ලැබිය හැකි ලාභය.
(ඈ)ඒ වෙළඳ ව්‍යාපාරය මගින් සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යාවශ්‍ය ස්වභාවය

| අනු අංකය | ව්‍යාපාර ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු.750.00 ඉක්මවන, එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු.1500.00 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| 01 | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | කොණ්ඩා පැකසීමේ ස්ථාන, බාබර් සාප්පු, සැලුන් හා රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | බේකරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 06 | කිරි පට්ටියක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 07 | පිහිනුම් තටාක පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 08 | අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | බත් කඩ, ආපනශාලා, තේ හෝ කෝපි කඩ පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | නවාතැන් පොළක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ලොන්ඩරි පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | කර්මාන්ත ශාලා පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15 | සංචාරක වෙළඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන පවත්වාගෙන යාම<br>1. සිමෙන්ති විකිණීම.<br>2. කලු ගල්, ගල් කුඩු විකිණීම<br>3. වැලි, බොරළු විකිණීම.<br>4. ගඩොල් විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |
| 17 | අප්‍රසන්න හෝ අන්තරාදායක ව්‍යාපාර -<br>1. කබොක්, බොරළු, කළු ගල් වලක් හෝ පස් සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම හෝ විකිණීම. | 500.00 | 750.00 | 1000.00 |



CamScanner

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2. කළුගල් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.<br>3. වී මෝලක් හෝ ධාන්‍ය තුනපහ වර්ග ඇඹරුම්හලක් පවත්වාගෙන යාම.<br>4. පොල්තෙල් මෝලක් පවත්වාගෙන යාම.<br>5. වාහන සේවා සපයන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම. (සර්විස් සෙන්ටර්)<br>6. ලී මෝලක් හෝ වඩුමඩුවක් පවත්වාගෙන යාම<br>7. ගෑස් ගබඩා කර තබා ගැනිම හා අලෙවි කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>8. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම<br>9. කම්හලක් පවත්වාගෙන යාම<br>10. තොග වශයෙන් විකිණිම සඳහා නරක් වන සුළු ආහාර ද්‍රව්‍ය විකිණිමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>11. වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම<br>12. ශිතකරණ අලුත්වැඩියා කරන ස්ථාන පවත්වාගෙන යාම<br>13. මෝටර් රථ, මෝටර් සයිකල්, පාපැදි, ත්‍රිවිල් අලුත්වැඩියා කරන ස්ථාන (ගරාජ්) පවත්වාගෙන යාම<br>14. මුදවපු කිරි, කිරි ආශ්‍රිත කෑම වර්ග අලෙවි කිරිම හා ගබඩා කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම<br>15. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම<br>16. ගිණිකෙළි භාණ්ඩ අලෙවි කිරිමේ හා ගබඩා කිරිමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ජේ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

6. <u>තිස්සමහාරාම ප්‍රාදේශිය සභාව විසින් සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්දක් අය කිරිම සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 150(I) වගන්තිය මගින් පැවරි ඇති බලතල ප්‍රකාරව ඒ ඒ ස්ථානවල වාර්ෂික වටිනාකම පදනම් කර ගනිමින් උපලේඛනයෙහි දක්වා ඇති ස්වභාවයේ කර්මාන්ත වෙතින් උපලේඛනයෙහි දක්වා ඇති ආකාරයට කර්මාන්ත බද්දක් 2026 වර්ෂය වෙනුවෙන් අය කිරිම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි .

උප ලේඛන 01 -

| අනු අංකය | බදු ස්වභාවය | වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන | වාර්ෂික වටිනාකම රු.1500.00 නොඉක්මවන | වාර්ෂික වටිනාකම රු.1500.00 ඉක්මවන |
|---|---|---|---|---|

| | | අවස්ථාවක | අවස්ථාවක | අවස්ථාවක |
|---|---|---|---|---|
| 01 | පැණි වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 02 | යන්ත්‍රානු සාරයෙන් හෝ යන්ත්‍ර නොමැතිව ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 03 | කොහු හෝ කෙඳි වර්ග නිපදවීම සහ කොහු හෝ කෙඳි වර්ග වලින් සාදනු ලබන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 04 | යන්ත්‍ර නොමැතිව හෝ යන්ත්‍රානුසාරයෙන් පාවහන්, බෑග් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 05 | ඇඟලුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 06 | හකුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 07 | සබන් සහ සබන් කුඩු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1,000.00 |
| 08 | අත්කම් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

7. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි ස්ථානයන්ගෙන් අය කිරීම සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 149 වන මඟින් හා 2017.06.09 දිනැති අංක 2023 ගැසට් පත්‍රය මඟින් පිළිගන්නට යෙදුණු 1952 අංක 06 දරණ (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ I වන උප වගන්ති ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් සාදා ඇති අතුරු ව්‍යවස්ථා මාලාවේ 13.14 අතුරු ව්‍යවස්ථාවන් මඟින් නිරූපිත හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලයේ ලියාපදිංචි ස්ථානයන්ගෙන් අතුරු ව්‍යවස්ථා මාලාවන්හි සඳහන් පරිදි වෙළඳ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා එම ස්ථානයේ ප්‍රවර්තන වර්ෂයට පෙර වර්ෂයේ ආදායමින් 1% ක ප්‍රමාණයක් අය කර 2026 වර්ෂය සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.



CamScanner

8. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂය සඳහා වරිපනම් බදු අය කිරීම සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ පනතේ 146(1) වන උප වගන්තිය යටතේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 392/20 හා 1986.03.04 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශ කර ඇත්තා වූ , ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ නිවාස වල, ගොඩනැගිලිවල, ඉඩම්වල,ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂය සඳහා වූ හා ප්‍රවර්ථන වර්ෂය 2026 වර්ෂය සඳහා සම්මත කළ යුතු බවටත්,

එකී තක්සේරුව මත 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ 134(1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපල මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් 7% ක වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කළ යුතු බවටත්,තවද 2026 වර්ෂයෙන් පහත සඳහන් එක් එක් කාර්තු වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික වරිපනම් බද්ධ තිස්සමහාරාම ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත් , එලෙස වාර්ෂික වරිපනම් බද්ධ 2026 වර්ෂයේ ජනවාරි 31 දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම්, වාර්ෂික වරිපනම් බද්දෙහි ප්‍රමාණයෙන් 10% ක වට්ටමක් ද එකී උප ලේඛනයේ එක් එක් කාර්තුව ඉදිරියෙහි 3 වන තීරයේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම්, එක් කාර්තුවකට අදාළ මුදලින් 5 % ක වට්ටමක් ද තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01

| <u>කාර්තුව</u> | <u>ගෙවිය යුතු දිනය</u> | <u>වට්ටම් සඳහා හිමිකම් ලබන අවසාන දිනය</u> |
|---|---|---|
| පළමු කාර්තුව | 2026.03.31 | 2026.01.31 |
| දෙවන කාර්තුව | 2026.06.30 | 2026.04.30 |
| තුන් වන කාර්තුව | 2026.09.30 | 2026.07.31 |
| හතරවන කාර්තුව | 2026.12.31 | 2026.10.31 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

9. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් සභා බලප්‍රදේශය තුළ 2026 වර්ෂය සඳහා ක්‍රීඩා පිටි හා භූමි භාගයන් ලබා දීමේදී අය කළ යුතු ගාස්තු සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 (1) වගන්තියෙන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බල තල ප්‍රකාරව 2013 මැයි 17 දින 1811 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1v (ආ) කොටසේ පළාත් සභා අතිවිශේෂ ගැසට්පත්‍ර වල පලාතේ සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට අයත් ක්‍රීඩා පිටි හා භූමි භාගයන් ලබා දීමේදී අය කල යුතු ගාස්තුන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 09(3) වගන්ති අනුව පහත ආකාරයට අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

| අනු අංකය | ස්ථානය | ගාස්තුව (දිනකට) | තැන්පත් මුදල |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| 01 | දෙබරවැව පොදු ක්‍රීඩාංගනය | | |
| | මුදල් ඉපයීම් නොවන කටයුතු සඳහා | රු. 15,000.00 (දිනකට) | රු.10,000.00 (දිනකට) |
| | මුදල් ඉපයීම් වන කටයුතු සඳහා | රු. 20,000.00 (දිනකට) | රු.100000.00 (දිනකට) |
| | ක්‍රීඩා කටයුතු සඳහා (පාසල්,රජයේ ආයතන,ක්‍රීඩා සමාජ හැර) | රු. 7500.00 (දිනකට) | - |
| 02 | පන්නගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගණය | | |
| | මුදල් ඉපයීම් නොවන කටයුතු සඳහා | රු. 10000.00 (දිනකට) | රු.10,000.00 (දිනකට) |
| | මුදල් ඉපයීම් වන කටයුතු සංගීත ප්‍රසංග | රු. 15000.00 (දිනකට) | රු. 25000.00 (දිනකට) |
| | ක්‍රීඩා කටයුතු සඳහා (පාසල්,රජයේ ආයතන,ක්‍රීඩා සමාජ හැර) | රු. 5000.00 (දිනකට) | - |
| 03 | ලොරි රථ නැවතුම්පොල දිනකට | රු. 10000.00 (දිනකට) | - |
| | ලොරි රථ නැවතුම්පොල, පැරණි බස් නැවතුම්පල භූමිය, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ඉදිරිපිට සම්පූර්ණ භූමියෙන් භාගයකට අඩු ප්‍රමාණයක් සඳහා දෙන අවස්ථා වලදී වර්ග අඩියක් සඳහා | රු. 10.00 | - |
| 04 | සභාව ඉදිරිපිට හිස් භූමිය | රු.3000.00 (දිනකට) | - |
| 05 | තිස්සමහාරාම පොලිස් ස්ථානය ඉදිරිපිට භූමිය | රු2000.00 (දිනකට) | - |
| 06 | තිස්සමහාරාම බස් නැවතුම ඉදිරිපිට භූමිය | රු2000.00 (දිනකට) | - |
| 07 | තිස්සමහාරාම පොදු වෙළඳ පොල ඉදිරිපිට භූමිය | රු5000.00 (දිනකට) | - |
| 08 | දෙබරවැව පොළ භූමිය (අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා) | රු2000.00 (දිනකට) | - |
| 09 | පන්නෙගමුව පොළ භූමිය (අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා) | රු2000.00 (දිනකට) | - |
| 10 | දෙබරවැව පොළ භූමිය (වෙනත් කටයුතු සඳහා ) | රු.5000.00 (දිනකට) | - |
| 11 | පන්නෙගමුව පොළ භූමිය(වෙනත් කටයුතු සඳහා ) | රු.5000.00 (දිනකට) | - |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

10. <u>2026 වර්ෂය තුළ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පන්නෙගමුව සති පොළෙහි අය කළ යුතු ගාස්තු සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පන්නෙගමුව සති පොළෙහි ගාස්තු 2026 වර්ෂය තුලදී පහත දැක්වෙන ආකාරයට අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

| | |
|---|---|
| ඩබල් වීල් ලොරි රථ සඳහා | රු. 300.00 |
| සිංගල් වීල් ලොරි රථ සඳහා | රු. 175.00 |

| | |
|---|---|
| කුඩා ප්‍රමාණයේ ලොරි රථ සඳහා (බඩි) | රු. 120.00 |
| අඩි 10x8ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 80.00 |
| අඩි 10x5ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 60.00 |
| අඩි 8x5ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 50.00 |
| මාලු ලෑල්ලක් සඳහා | රු. 100.00 |
| අඩි 4x4කඩ පිල් | රු. 20.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

11. <u>2026 වර්ෂය තුළ දී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දෙබරවැව සති පොළෙහි අය කළ යුතු ගාස්තු සඳහා වූ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දෙබරවැව සති පොළෙහි ගාස්තු 2026 වර්ෂය තුලදී පහත දැක්වෙන ආකාරයට අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

| | |
|---|---|
| අඩි 9x5 ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 100.00 |
| අඩි 6x5 ප්‍රමාණයේ කඩ අල්ලි | රු. 60.00 |
| අඩි 7 1/2x5 ප්‍රමාණයේ කඩ අල්ලි (ගොඩනැගිල්ල ඇතුළත) | රු. 150.00 |
| මාලු ලෑල්ලක් සඳහා | රු. 200.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

12. <u>2026 වර්ෂය තුළදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ප්‍රදර්ශනය කරන ලද දැන්වීම් පුවරු සඳහා අය කළ යුතු ගාස්තු සඳහා වූ යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 vii ඊ වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව 1988.08.23 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ 527/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ iv (ආ) කොටස මඟින් ප්‍රසිද්ධ කරන ලද 1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වන වගන්තියේ 01 වන උප වගන්තිය අනුව, විෂය භාර අමාත්‍යවරයා විසින් පනවා ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වන අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව 2026 වර්ෂය සඳහා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කෙරෙන දැන්වීම් පුවරු සඳහා පහත දැක්වෙන ගාස්තු නියමයන් අනුව, දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

- ❖ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීමක් සඳහා වර්ග අඩියකට රු. 130.00 බැගින් වූ ගාස්තුවක්.
- ❖ රෙදි හෝ ඉටි රෙදි භාවිතා කරනු ලබන දැන්වීමක් සඳහා මාසයක් හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩියකට රු. 40.00 බැගින් වූ ගාස්තුවක්.

❖ කඩදාසියේ මුද්‍රිත දැන්වීමක් මාසයක් හෝ ඉන් කොටසක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට රු. 10.00 බැගින් වූ ගාස්තුවක්
❖ පවත්නා වර්ෂයේ දෙසැම්බර් මස 31 දින දක්වා, බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ඩිජිටල් දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු. 1,500.00 බැගින් වූ ගාස්තුවක් අය කිරීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

13. <u>2026 වර්ෂය තුළදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පවත්වනු ලබන විනෝද කටයුත්තක් සඳහා අය කළ යුතු විනෝද බදු ගාස්තු සඳහා වූ යෝජනාව</u>

විනෝද බදු මුදල් ආඥා පනතේ 2 වන වගන්තියේ i වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයන්හි පවත්වනු ලබන විනෝද කටයුත්තකට ඇතුළත් වීම සඳහා කරන ලද ගෙවීම් වලින් පහත දැක්වෙන ආකාරයට 2026 වර්ෂයට විනෝද බදු අය කිරීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

❖ ප්‍රේක්ෂකයන්ගෙන් මුදල් අය කර ප්‍රදර්ශනය කරනු ලබන චිත්‍රපට සංදර්ශනයක් සඳහා සියයට හතයි දශම පහක (7.5%) විනෝද බද්දක් පැනවීම.
❖ මුදල් අය කොට, පවත්වනු ලබන සංගීත සංදර්ශන හෝ වෙනත් ඕනෑම විනෝද කටයුත්තක් සඳහා සියයට පහළොවක (15%) බද්දක් පැනවීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

14. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළහි 2026 වර්ෂයට ගාස්තු අය සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු, තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සඳහා උප ලේඛනයේ දැක්වෙන පරිදි, 2026 වර්ෂයට ගාස්තු අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01 -

❖ තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ

| | | | |
|---|---|---|---|
| I. | ලොරි රථ, බස් රථ සඳහා | - | රු. 100.00 |
| II. | වෑන් රථ සඳහා | - | රු. 100.00 |
| III. | මෝටර් රථ සඳහා | - | රු. 50.00 |
| IV. | ත්‍රීවිල් රථ සඳහා | - | රු. 50.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.



CamScanner

15. 2026 වර්ෂයේදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම මහසෙන්පුර ආදාහනාගාරයේ ආදාහනයක් සිදු කිරීම වෙනුවෙන් ගාස්තු අය සඳහා වූ යෝජනා.

2026 වර්ෂයේදී තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු තිස්සමහාරාම මහසෙන්පුර ආදාහනාගාරයේ ආදාහනයක් සිදු කිරීම වෙනුවෙන් ගාස්තු අය කිරීම උප ලේඛනයේ දැක්වෙන ලෙසට විය යුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01

- තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ මෘත දේහයක් ආදාහනය කිරීම වෙනුවෙන් ගාස්තුව - රු. 18,400.00
- තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත වූ මෘත දේහයක් ආදාහනයක් සිදු කිරීම වෙනුවෙන් ගාස්තුව - රු. 20,000.00

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

16. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු, රථවාහන බදු දීම වෙනුවෙන් 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු, රථවාහන බදු දීම වෙනුවෙන් උප ලේඛනයේ සඳහන් පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01

| අනු අංකය | රථවාහන වර්ගය | ගාස්තුව (රු) |
|---|---|---|
| 01 | මෝටර් ග්‍රේඩරය | රු. 9,000.00 (මීටර් පැයකට) |
| 02 | බැකෝ යන්ත්‍රය | රු. 5,500.00 (මීටර් පැයකට) |
| 03 | ටොන් 8-10 වයිබ්‍රේටිං රෝල | රු. 5,500.00 (මීටර් පැයකට) |
| 04 | කියුබ් 2 ½ ටිපර් රථය | රු. 18,000.00 (දිනකට) |
| 05 | පොඩි රෝල ටොන් 1-2 | රු. 6000.00 (දිනකට) |
| 06 | ට්‍රැක්ටර් බවුසරය පමණක් (වාණිජ කටයුතු සඳහා ) ලීටර් 2000 | රු. 1,500.00 (දිනකට) |
| 07 | ට්‍රැක්ටරය , බවුසරය 2000 ලීටර් | ▪ බවුසරය දිනකට රු.1,500.00<br>▪ කිලෝමීටරයකට රු.250.00 බැගින්<br>▪ ජල ගාස්තුව සමඟ |



CamScanner

| | | |
|---|---|---|
| 08 | තවටුව | පළමු කිලෝ මීටර් 01 සිට කිලෝ මීටර් 10 දක්වා රු. 8000.00 ක මුදලක් අය කරනු ලබයි.<br>වැඩි වන සෑම කිලෝමීටරයකටම රු. 400.00 ක් බැගින් වැඩි වේ. |

<u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ලීටර් 6000 (6000l) ජල බවුසරයේ සේවාව ලබා දීම සම්බන්ධව ගාස්තු අය කිරීම</u>

- පළමු කිලෝ මීටර් 01 සිට කිලෝ මීටර් 30 දක්වා - රු. 5,500.00
- පළමු කිලෝ මීටර් 30 න් පසු වැඩි වන සෑම කිලෝ මීටරයකටම- රු. 250.00 බැගින් වැඩි විය යුතුය.

<u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ලීටර් 8000 (8000l) ජල බවුසරයේ (ගිණි නිවීමට හැකි වන පරිදි සකස් කර ඇති) සහ ලීටර් 16000 ජල බවුසරයේ සේවාව ලබා දීම වෙනුවෙන් ගාස්තු අය කිරීම</u>

- බල ප්‍රදේශය ඇතුළත බවුසරය ලබා දීම ජලය රහිතව (දිනකට) - රු. 15,000.00
- බල ප්‍රදේශයෙන් පිටත බවුසරය ලබා දීම ජලය රහිතව (දිනකට) - රු. 20,000.00
- ජල බවුසරයක් සඳහා (ජලය සහිතව) ගාස්තු අය කිරීම - කිලෝ මීටර් 01 සඳහා රු.250.00 ක් සහ ජල ගාස්තුව

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

17. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ සේවා ලබා දීම වෙනුවෙන් 2026 වර්ෂය තුළ ගාස්තු අය කිරීම සඳහා වූ යෝජනාව.</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ගලි බවුසරයේ සේවා ලබා දීම වෙනුවෙන් උප ලේඛනයේ සඳහන් පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

I. තිස්සමහාරාම ප්‍රදේශය තුළ නේවාසික ස්ථානයක එක් බවුසරයක් ඉවත් කිරීම (40km ඇතුළත) - රු. 9,000.00
කිලෝ මීටර් 40 වැඩි වන සෑම කිලෝ මීටර් එකක් සඳහා - රු. 130.00

II. තිස්සමහාරාම ප්‍රදේශය තුළ වාණිජ ස්ථානයක එක් බවුසරයක් ඉවත් කිරීම සඳහා (40km ඇතුළත) - රු. 12,000.00

III. තිස්සමහාරාම ප්‍රදේශයෙන් පිටත නේවාසික ස්ථානයක් සඳහා - රු. 10,500.00
කිලෝ මීටර් 40 වැඩි වන සෑම කිලෝ මීටර් එකක් සඳහා - රු. 130.00

IV. තිස්සමහාරාම ප්‍රදේශයෙන් පිටත වාණිජ ස්ථානයක් සඳහා - රු. 13,000.00
කිලෝ මීටර් 40 වැඩි වන සෑම කිලෝ මීටර් එකක් සඳහා - රු. 130.00

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

18. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වැසිකිළි හා නාන ස්ථාන සඳහා 2026 වර්ෂය තුළ ගාස්තු අය කිරීම සඳහා වූ යෝජනාව.</u>



CamScanner

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වැසිකිළි හා නාන ස්ථාන සඳහා පහත දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛන 01

| අනු අංකය | ස්ථානය | අය කරන ලද මුදල (රු) |
|---|---|---|
| 01 | තිස්ස පූජා නගර වැසිකිළිය | එක් පුද්ගලයෙකුගෙන්රු. 30.00 ක මුදලක් අය කරනු ලබයි. |
| 02 | තිස්ස බස්නැවතුම්පොළ නව වැසිකිළිය | |
| 03 | අකුරුගොඩ හන්දියේ වැසිකිළිය | |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

19. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන කොම්පොස්ට් පොහොර 2026 වර්ෂය තුළ අලෙවි කිරීමේ දී අයකරනු ලබන ගාස්තු සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු කොම්පොස්ට් මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන කොම්පොස්ට් පොහොර අලෙවි කිරීමේ ගාස්තු උප ලේඛනයේ දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා අය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

කිලෝග්රෑම 1 ක් (1Kg) - රු.20.00 බැගින්

බෑග් සඳහා

50Kg - රු.100 .00

25Kg - රු.75.00

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

20. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන වලින් කසළ ඉවත් කිරීමේ සේවාව වෙනුවෙන් 2026 වර්ෂය තුළ ගාස්තු අය කිරීම සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික ස්ථාන වලින් කසළ ඉවත් කිරීමේ සේවාව වෙනුවෙන් උප ලේඛනයේ දැක්වෙන පරිදි 2026 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

උප ලේඛනය -

- කිලෝ මීටර් 1 සිට කිලෝ මීටර් 10 දක්වා
  - කාමර 10 ක් හෝ ඊට අඩු දිනකට - රු.1563.00
  - කාමර 11 සිට 20 දක්වා දිනකට - රු.3126.00
  - කාමර 21 සිට 30 දක්වා දිනකට - රු.4689.00
  - කාමර 30ට වැඩි දිනකට - රු.9378.00

- කිලෝ මීටර් 11 සිට කිලෝ මීටර් 20 දක්වා වැඩි වන කිලෝ මීටර් 1 සඳහා පහත පරිදි ගාස්තු එකතු වීමක් සිදු වේ.
  - කාමර 10ක් හෝ ඊට අඩු - රු.156.00
  - කාමර 11 සිට 20 දක්වා - රු.313.00
  - කාමර 21 සිට 30 දක්වා - රු.469.00
  - කාමර 30ට වැඩි - රු.938.00
- කිලෝ මීටර් 21 සිට වැඩි වන සෑම කිලෝ මීටර් 1ක් සඳහා පහත පරිදි ගාස්තු එකතු වීමක් සිදු වේ.
  - කාමර 10ක් හෝ ඊට අඩු - රු.195.00
  - කාමර 11 සිට 20 දක්වා - රු.391.00
  - කාමර 21 සිට 30 දක්වා - රු.589.00
  - කාමර 30ට වැඩි - රු.1173.00

උප ලේඛන 02

- ආපන ශාලා සඳහා දිනකට - රු.1735.00

(අවම වශයෙන් සතියකට දින 02 ක් කසළ ඉවත් කිරීමේ සේවාව ලබා ගත යුතුය)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

21. <u>2026 වර්ෂයේ සිට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් අය කරනු ලබන විනෝද බදු,අය කිරීමේ ප්‍රතිශතය සියයට විස්සක (20%) සිට සියයට පහළොවක් (15%) දක්වා සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව</u>

විනෝද බදු අයකිරීම සඳහා මෙතෙක් පැවති සියයට විස්සක (20% ) විනෝද බදු මුදල, සියයට පහළොවක (15%) දක්වා අඩු කිරීමට 2025.10.07 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ දී තීරණය විය. ඒ අනුව 2026 වර්ෂයේ සිට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් අය කරනු ලබන විනෝද බදු අය කිරීමේ ප්‍රතිශතය සියයට විස්සක (20%) සිට සියයට පහළොවක් (15%) දක්වා සංශෝධනය කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

22. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වාහන අළුත්වැඩියා කිරීමට ලබාගන්නා ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු පහත අංක දරණ වාහන අළුත්වැඩියා කිරීමට ලබාගන්නා ලද ඇස්තමේන්තු සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි

| අනු අංකය | වාහන අංකය | ආයතනය | මුදල (රු) | විස්තරය |
|---|---|---|---|---|
| 01 | 227-5807 ජල බවුසරය | තිළිණ මෝටර්ස් | 162,000.00 | ක්ලච් ප්ලේට් අළුත්වැඩියා කිරීම,එන්ජින් පම්ප් අළුත්වැඩියාව,වැකුම් පද්ධතිය අළුත්වැඩියාව ආදිය |

| | | | | |
|---|---|---|---|---|
| 02 | 56-1099 කැබ් රථය | තිළිණ මෝටර්ස් | 476,500.00 | එන්ජිම අළුත්වැඩියාව,දොර ලොක්,වින්ස්ක්‍රීන් සැදීම,දුනු බුෂ් ගැසීම,ආදිය |
| 03 | LL - 6981 FOTON ටිපර් රථය | තිළිණ මෝටර්ස් | 65500.00 | රේඩියේටර් සුද්ද කිරීම,එන්ජින් හෙඩ් ජේස් කිරීම,වැල් ග්‍රයින් කිරීම,<br>ටර්බෝ හෝස් සඳහා,වැඩ කුලිය ආදිය සඳහා |
| 04 | MG - 330 මෝටර් ග්‍රේඩරය | තිළිණ මෝටර්ස් | 497000.00 | Ripper shunk,ripper tooth ආදිය සඳහා සහ සීල් කිට්,ජැක් සීල්, මෝටර් සීල් කිට්,රේඩියේර්කුලන්ට්,ඔයිල්,පවර් ඉලෙක්ට්‍රික් සිස්ටම්,වැකුම් සිසිටම ආදිය |
| 05 | MG - 330 මෝටර් ග්‍රේඩරය | තිළිණ මෝටර්ස් | 275350.00 | හයිඩ්‍රොලික් ඔයිල්,ට්‍රාන්ස්මිෂන් ඔයිල්,excalator cable ආදිය සඳහා |
| 06 | ZA-5200 බැකො ලොඩරය | තිළිණ මෝටර්ස් | 79500.00 | එන්ජිම අධික ලෙස රත්වීම,POWER TRCK LINK හි දෝෂ සැකසීම,හා වැඩ කුලිය |
| 07 | LO-3589 ජල බවුසරය | තිළිණ මෝටර්ස් | 258700.00 | ක්ලච් ප්ලේට් සවි කිරීම, Priwheelසැකසීම, හා වැඩ කුලිය |
| 08 | ZA-5200 බැකො ලෝඩරය | තිළිණ මෝටර්ස් | 194550.00 | සීල් කිට්,කූලින් ෆෑන්,ඔයිල් ෆිල්ටර්, හා වැඩ කුලිය |
| 09 | LO-3589 ජල බවුසරය | තිළිණ මෝටර්ස් | 56500.00 | ස්ටාටර් මෝටරයේ දෝෂ සැකසීම,පට්ටලේ වැඩ සහ වැඩ කුලිය |
| 10 | LL-7379 ගලි බවුසරය | තිළිණ මෝටර්ස් | 40300.00 | ක්ලච් සර්වෝ පම්ප් සවි කිරීම සහවැඩ සහ වැඩ කුලිය |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ <u>ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා</u>

➢ <u>කාර්මික සේවා කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනා</u>



CamScanner

23. සංචාරක සංවර්ධන වැඩසටහන යටතේ කිරින්ද අඳගලවැල්ල වෙරළ තීරයට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ප්‍රජා පාදක සංවිධානයක් වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා වූ යෝජනාව

සංචාරක සංවර්ධන වැඩසටහන යටතේ කිරින්ද අඳගලවැල්ල වෙරළ තීරයට ප්‍රවේශ වන මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මි.02 ක ප්‍රතිපාදන හිමි වී ඇති බැවින් සෘජු කොන්ත්‍රාත් පැවරීම යටතේ ප්‍රජා පාදක සංවිධානයක් වන අන්දරගස්යාය, මාගම, තිස්සමහාරාම ලිපිනයෙහි පදිංචි අන්දරගස්යාය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එල්.එම්.අසාර් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

24. තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත මාර්ගයන් සංවර්ධනය කිරීම සඳහා සඳහා වූ යෝජනාව.

තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන මත පහත සඳහන් මාර්ගයන් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපාදන හිමි වී ඇති බැවින් එම මාර්ග සංවර්ධනය සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | මාර්ගයේ නම | ඇස්තමේන්තු වටිනාකම (රු) |
|---|---|---|
| 01 | එකමුතුගම - රාජාධිරාජසිංහ මාවතේ කරුණාවතී මහත්මියගේ නිවස අසල සිට සුනෙත් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 198082.15 |
| 02 | ජුල්පල්ලම පාලම අසල සිට පුබුදුගම හන්දිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 198082.15 |
| 03 | විහාරමහාදේවිපුර - ගොවියා දෙවියා මාවත (තිස්ස - කිරින්ද ප්‍රධාන මාර්ගයේ සිට) සංවර්ධනය කිරීම | 594236.97 |

➢ අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා

මෙම ප්‍රතිපාදන තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලැබුණ ද ප්‍රතිපාදන වෙන් කරන ලද්දේ දකුණු පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය මගින් වන බැවින් ඉහත යෝජනාව "දකුණු පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය මගින් වෙන් කරන ලද තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ලැබෙන ප්‍රතිපාදන" ලෙස නිවරදි විය යුතු බවට ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් වමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.



CamScanner

➢ ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

➢ පරිසර පොදු පහසුකම් කාරක සභාව මගින් ඉදිරිපත් කරන ලද යෝජනාව

25. උද්ධකන්දර කසල මධ්‍යස්ථානයෙහි ඉදිකිරීමට යෝජිත ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයෙහි වැඩකටයුතු ආරම්භ කිරීම සඳහා එහි බිම් සකස් කිරීම සහ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම අනුමැතිය ලබාගැනීම සඳහා වූ යෝජනාව

2025.10.02 දිනැති පරිසර කමිටුවේ යෝජනා පරිදි උද්ධකන්දර කසල මධ්‍යස්ථානයෙහි අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයෙහි වැඩකටයුතු ආරම්භ කිරීමටත්, එහි මුල් ගල් තැබීමේ උත්සවය 2025.10.25 වන දිනට යොදාගැනීමටත්, තවද එම ස්ථානයෙහි බිම් සකස් කිරීමේ කටයුතු හා ඉදිකිරීම් කටයුතු ඇතුළු සැලසුම් සකස් කිරීම සඳහා පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- ගොඩනැගිලි සැලසුම්, ඉඩම් සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- පිරිසිදු කිරීම් හා බිම් සකස් කිරීම සඳහා රු.1,800.00 ක දෛනික වැටුපට මිනිස් දින 50 ක් සඳහා කම්කරුවන් යොදා ගැනීම.
- පිරිසිදු කිරීම් හා බිම් සකස් කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම.
- පැල වර්ග (පළතුරු හා මල්) සිටුවා උද්‍යානය සකස් කිරීම.
- කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙහි ගේට්ටුව අලුත්වැඩියා කිරීම.
- කුකුළු ගොවිපළක් ආරම්භ කිරීම.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලුකා කුමුදුනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

➢ ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

26. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය කටයුතු විධිමත් කරගැනීමට, පරිඝනක යන්ත්‍ර 08 මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය කටයුතු විධිමත් කරගැනීම වෙනුවෙන්, පරිඝනක යන්ත්‍ර 08 මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ආයතනය | විස්තරය | මුදල (රු) |
|---|---|---|---|
| 01 | බෙස් එච් පී පුද්ගලික සමාගම | පරිගණක මිලදී ගැනීම | 2,276,550.04 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

27. රණකෙලිය අතුරු මාර්ගයේ බෝක්කුව සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා යෝධකණ්ඩිය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත කොන්ත්‍රාත්තුව පැවරීමේ යෝජනාව

රණකෙලිය අතුරු මාර්ගයේ බෝක්කුව සකස් කිරිමෙ ව්‍යාපෘතිය සිදු කිරිම සඳහා අංක 15, යෝධකණ්ඩිය, තිස්සමහාරාම ලිපිනයෙහි පදිංචි යෝධකණ්ඩිය ග්‍රාම සංවර්ධන සමිතිය වෙත කොන්ත්‍රාත්තුව පැවරිම සුදුසු බව ගරු මහ සභාවට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලුකා කුමුදුනී මහත්මිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

28. <u>කොන්ත්‍රාත් ආයතන විසින් තැන්පත් කරන ලද ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සඳහා වූ යෝජනාව</u>

පහත සඳහන් ව්‍යාපෘතින් සඳහා සුදුසුකමලත් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම්ගතව ඇති බැවින් , එම ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් ආයතන විසින් තැන්පත් කරන ලද ලංසු සුරක්ෂණ නිදහස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතිය | කොන්ත්රාත් ආයතනය | මුදල (රු) |
|---|---|---|---|
| 01 | නැදිගම්විල නවෝදා ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාළව කිරිඳිඔයේ ළිදක් සකස් කර ජලය පොම්ප කර බෙදා හැරීම.(ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තු සමඟ ) | එස් ෆෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ | 40,000.00 |
| 02 | තිස්සමහාරාම බස් නැවතුම්පොළ නවීකරණය කිරීම | සී.ජේ.කන්ස්ට්රක්ෂන්, නො.105, විල්මට් වීදිය, හම්බන්තොට. | 22,000.00 |
| 03 | ඉක්කපල්ලම පාසලේ ප්‍රධාන ගේට්ටුව ඉදිරිපට ප්‍රධාන බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරීම | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල, තිස්සමහාරාම | 50,000.00 |
| 04 | | එස් ෆෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ | 50,000.00 |
| 05 | | දර්ශන මැන් පවර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්, 106/1/ඒ, වෝල්ස් වීදිය, මෝදර, කොළඹ 15 | 50,000.00 |
| 06 | | පී.එච්.ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ්, නො.25/1/බී, පැඟිරිවත්ත, බෙලිඅත්ත | 50,000.00 |
| 07 | බහුකාර්ය ගොඩනැගිල්ලේ රථවාහන නැවතුම්පොළ භූමිය කාපට් අතුරා සංවර්ධනය කිරීම සහ බිම් මහලේ අනෙකුත් අලුත්වැඩියා කටයුතු සිදු කිරීම | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල, තිස්සමහාරාම | 100,000.00 |
| 08 | | එස් ෆෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ | 100,000.00 |
| 09 | තිස්ස පූජා නගර රථවාහන නැවතුම්පොළ අසල වැසිකිලි | ලේබා කන්ස්ට්‍රක්ෂන්, හැළඹගස්වල, තිස්සමහාරාම | 175,000.00 |

| | | | |
|---|---|---|---|
| 10 | පද්ධතිය අලුත්වැඩියා කිරීම. | එස් ජෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ | 175,000.00 |
| 11 | ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ඉදිකිරීම | එස් ජෝ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම,නො.184/2, සිරිනන්ද ජෝතිකාරාම මාවත, තලවතුගොඩ | 400,000.00 |
| 12 | | එස්.පී.ඩී.කන්ස්ට්‍රක්ෂන්, නො.98, ගිනිපෙට්ටි පාලම අසල, යාය 02, කොළඹගේආර, ඇඹිලිපිටිය | 400,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**29. දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2024 වර්ෂයේ සිදු කරන ලද ව්‍යාපෘතීන්හි රඳවුම් මුදල් නිදහස් කිරීම සඳහා වූ යෝජනාව**

දකුණු පළාත් සංවර්ධන සැලැස්ම - 2024 වර්ෂයේ සිදු කරන ලද ව්‍යාපෘතීන්හි රඳවුම් මුදල් නිදහස් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත් ආයතනය | රඳවුම් මුදල (රු) |
|---|---|---|---|
| 01 | ආපදා කළමනාකරණ ගොඩනැගිල්ලේ ආයුර්වේද මධ්‍යස්ථානය පිහිටුවීම | එම්.එස්.තිස්ස උදාර ගොවි සංවිධානය, නෙළුම් පෙදෙස, සේනානායක මාවත, තිස්සමහාරාම | 357,306.68 |
| 02 | ලීටර් 5000 ජල ටැංකි ආධාරක 07 ක් ස්ථාපිත කිරීම | එම්.එස්.තිස්ස උදාර ගොවි සංවිධානය, නෙළුම් පෙදෙස, සේනානායක මාවත, තිස්සමහාරාම | 35,355.63 |
| 03 | කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කසල තෝරන ගබඩාවේ වහලය සකස් කිරීම | කිරිදිඹය ඒකාබද්ධ ගොවි සමිති සංගමය, උඩුවිල, ගෝණගමුව, තිස්සමහාරාම. | 333,782.75 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**30. සුභ සාධක සේවාවක් ලෙස ගලි බවුසර් සේවාව නොමිලේ ලබා දීම සඳහා වූ යෝජනාව**

සමාජයේ රැකවරණය සහ ආරක්ෂණය ලැබිය යුතු කණ්ඩායම් සඳහා සුභ සාධක සේවාවන් සැපයීමේදී ,තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව වෙත ලැබෙන ඉල්ලීම් ඉටු කිරීම සඳහා එනම් වැඩිහිටි නිවාස,ළමා නිවාස ,මාතෘ නිවාස හා ආරන්‍ය සේනාසන ආදී ස්ථාන සඳහා ගලි බවුසර් සේවාව නොමිලේ ලබා දීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.



CamScanner

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදත් චමින්ද උයනහේවා මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

31. දේශීය ණය හා සංවර්ධන අරමුදල මගින් ණය මුදලක් ලබාගැනීම සඳහා වූ යෝජනාව

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා ටිපර් රථ 02ක් ලබාගැනීම වෙනුවෙන් දේශීය ණය හා සංවර්ධන අරමුදල මගින් ණය මුදලක් ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- වෙනත් යෝජනා

- ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා

32. උද්ධකන්දර කසල මධ්‍යස්ථානයෙහි අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයෙහි වැඩකටයුතු ආරම්භ කිරීම හා එහි මුල් ගල් තැබීමේ උත්සවයෙහි වියදම් ඇස්තමේන්තුව ඇතුළත් යෝජනාව

උද්ධකන්දර කසල මධ්‍යස්ථානයෙහි අභිනවයෙන් ඉදිකිරීමට යෝජිත ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයෙහි වැඩකටයුතු ආරම්භ කිරීම හා එහි මුල් ගල් තැබීමේ උත්සවය 2025.10.25 වන දිනට යොදාගැනීමට 2025.10.02 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභාව විසින් තීරණය කරන ලදි. ඒ අනුව එම උත්සවයෙහි වියදම් ඇස්තමේන්තුව පහත පරිදි ඉදිරිපත් කරමි.

| | |
|---|---|
| • වේදිකාව සහ මඩු කුලියට ලබා ගැනීම සඳහා | රු. 85,000.00 |
| • පුටු 300 ක් කුලියට ලබා ගැනීම සඳහා | රු. 6,000.00 |
| • පසුබිම් බැනරය මුද්‍රණය කිරීම | රු. 20,000.00 |
| • ශබ්ද විකාශන සඳහා | රු. 15,000.00 |
| • සංග්‍රහ කටයුතු සඳහා | රු. 30,000.00 |
| එකතුව | රු. 156,000.00 |

ඉහත දක්වන ලද වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි .
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

33. 2026 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව

2026 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීම දිනමිණ, තිනකරන්, ඩේලි නිව්ස් යන පුවත්පත් වල පළකිරීම වෙනුවෙන් රු. 126,024.00 වූ බිල්පත සඳහා ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.



CamScanner

**34. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දේපල 2026 වර්ෂය සඳහා වාර්ෂික බදු පදනම මත ලබාදීම පිළිබඳ වූ යෝජනාව</u>**

2026 වර්ෂය සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වාර්ෂිකව බදු පදනම මත ලබාදෙන දේපළ 2025.10.17 දින ටෙන්ඩර් කිරීමට කටයුතු කරන ලද අතර එම එක් එක් දේපළ සඳහා පහත සඳහන් පරිදි වැඩිම ලංසු ඉදිරිපත් කර තිබුණි.එම ලංසු මුදල පදනම් කර ගනිමින් එකී දේපළ වල බදු අයිතිය 2026 වර්ෂයේ ඒ ඒ අයදුම්කරුවන් සඳහා ලබා දීම සුදුසු බවත්, යම් අවස්ථාවක පළමු බදුකරු විසින් බදු අයිතිය ලබා ගැනීම ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩරය පිළිගෙන ඇති අනුපිළිවෙලට මීලග අයදුම් කරුවන් වෙත ටෙන්ඩර් බදු අයිතිය ලබා දීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ටෙන්ඩර් දේපළෙහි නම | 2026 වර්ෂයේ වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබූ අයගේ නම | ලංසු මුදල (රු.ශත) |
|---|---|---|---|
| 01 | පන්නගමුව පොදු වෙළඳපොළ සහ වැසිකිළිය | නලගමගේ කීර්තිරත්න මයා | 2,702,000.00 |
| 02 | දෙබරවැව පොදු වෙළඳ පොළ සහ වැසිකිළිය | ඩැනී හෙන්රිගේ රේනුකා කුමුදිනී මිය | 3,900,000.00 |
| 03 | තිස්සමහාරාම පූජා නගර රථ වාහන නැවතුම් පොළ | ඒ.එම්.ජී ප්‍රදීප් පුෂ්ප කුමාර මයා | 905,000.00 |
| 04 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | කරුපන් ඉන්දුනි මිය | 201,900.00 |
| 05 | තිස්සමහාරාම බස් නැවතුම් නව වැසිකිළිය | වෙලු කරුපයියා මයා | 100,500.00 |
| 06 | තිස්සමහාරාම පූජා නගර රථ වාහන නැවතුම් පොළ පොල් ඵලදාව (පොල් ගස් 08) | වැල්ල හේනගේ සිරිසේන මයා | 12,120.00 |
| 07 | අකුරුගොඩ හංදියේ වැසිකිළිය | අමරසේන අංගප්පුලිගේ මයා | 3,800.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**35. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු, 2026 වර්ෂය සඳහා බදු අයිතිය ලබාගැනීමට ඉදිරිපත් නොවූ දේපළ පිළිබඳ වූ යෝජනාව</u>**

2026 වර්ෂය සඳහා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු දේපළ 2025.10.17 දින ටෙන්ඩර් කර අතර එහිදී ටෙන්ඩර් නොවූ දේපළ වන, තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් ඵලදාව, තිස්සමහාරාම පැරණි බස් නැවතුම් පොළ පොල් ඵලදාව, අකුරුගොඩ හංදිය කඩ කාමර අසල වැසිකිළිය යන දේපල සඳහා කිසිදු ඉල්ලුම්කරුවකු ඉදිරිපත් නොවීය. එබැවින් එම දේපල

පහත අවම ලංසු මුදලට ප්‍රාදේශීය ටෙන්ඩරයක් මගින් ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | බදු විෂය | 2026 වර්ෂයේ අවම ලන්සුව | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ඇප මුදල (රු.ශත) | පෝරම ගාස්තුව (රු.ශත) |
|---|---|---|---|---|---|
| 01 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් ඵලදාව (පොල් ගස් 07) | 2,250.00 | 1,000.00 | 200.00 | 500.00 |
| 02 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් ඵලදාව (පොල් ගස් 03) | 3,855.00 | 1,000.00 | 200.00 | 500.00 |
| 03 | අකුරුගොඩ හංදිය කඩ කාමර අසල වැසිකිළිය | 15,500.00 | 1,000.00 | 200.00 | 500.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රත්න මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**36. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදේශක සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවය කරන ලද සින්නයියා පුෂ්පරාණි මිය නැවත සේවය පිහිටුවීම සඳහා වූ යෝජනාව</u>**

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2006.06.04 දින සිට ආදේශක සෞඛ්‍ය කම්කරු තනතුරට පත් කර ඇති සින්නයියා පුෂ්පරාණි මිය රා.ප.ච 25/2014 යටතේ 2016.09.02 දින සිට බල පැවැත්වෙන පරිදි තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය කම්කරු iii තනතුරකට ස්ථිර පත්වීම් ලබා ඇත. 2023.08.29 දිනෙන් පසු මැය නොදන්වා සේවයට වාර්තා නොකර විදේශ ගත වීම හේතුවෙන් ලේකම්ගේ අංක EST/02/02/01 හා 2023.09.04 දිනැති ලිපිය මගින් 2023.09.01 දින සිට තාවකාලිකව සේවය අත්හිටුවා ඇත.2024.07.22 දිනැති ලිපිය මගින් නැවත සේවය ලබා දෙන ලෙස ඉහත සේවක මහත්මිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇත. මෙම සේවක මහත්මියගේ වැඩ ,හැසිරීම හා පැමිණීම පෞද්ලික ලිපිගොනුව සතුදායක වන බැවින් හා වෙනත් කිසිදු ආකාරයේ ගැටළු සහගත තත්වයක් පෞද්ගලික ලිපි ගොනුව තුලින් පෙන්නුම් නොකරන බැවින් මැයගේ නැවත සේවය පිහිටු වීමට නිර්දේශ ලබා ගැනීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.පී.අනුර ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

**37. <u>තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන මහාසෙන්පුර ආදාහනාගාරයේ ආදාහන සිදු කිරීම සඳහා මිල දී ගන්නා ලද ගෑස් සිලින්ඩර් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව</u>**

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව යටතේ ක්‍රියාත්මක වන මහාසෙන්පුර ආදාහනාගාරයේ ආදාහන සිදු කිරීම සඳහා මිල දී ගන්නා ලද ගෑස් සිලින්ඩර් 07 සඳහා රු.117,691.04 මුදලක් සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.



CamScanner

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

38. දෙබරවැව පොළ භූමියේ කාණු පද්ධතියේ කොන්ක්‍රීට් කාණු ආවරණ සකස් කිරීමේ ව්‍යාපෘති කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා වූ යෝජනාව

දෙබරවැව පොළ භූමියේ කාණු පද්ධතියේ කොන්ක්‍රීට් කාණු ආවරණ සකස් කිරීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා පූල්පල්ලම, තිස්සමහාරාම ලිපිනයෙහි පදිංචි පූල්පල්ලම ග්‍රාම සංවර්ධන සමිතිය වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සුදුසු බව ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

39. තිස්සමහාරරාම ප්‍රාදේශීය සභාවේ කළමණාකරන සේවා නිලධාරී තනතුරෙහි සේවයේ නියුතු බී.ජ්.එස්.මධුෂානි ස්ථාන මාරු ක්‍රියාත්මක නොකර ආයතනයේ රඳවා ගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාව

තිස්සමහාරරාම ප්‍රාදේශීය සභාවේ කළමණාකරන සේවා නිලධාරී තනතුරෙහි සේවයේ නියුතු බී.ජ්.එස්.මධුෂානි මෙය වාර්ෂික ස්ථාන මාරු - 2025 යටතේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරු ලබා ඇති අතර එම ස්ථාන මාරුව අවලංගු කරන ලෙස ඉල්ලීම් කරමින් නිසි නිල ඔස්සේ ප්‍රධාන ලේකම් වෙත ඉල්ලීමක් ආයතනය ඉදිරිපත් කරන ලදි.එකී ලිපියට පිළිතුරු ලෙස ප්‍රධාන ලේකම්ගේ CSS/03/06/ANN.TR/2025(107) අංක හා 2025.10.07 දිනැති ලිපිය මඟින් උක්ත ස්ථාන මාරුව අවලංගු කල නොහැකි බව දන්වා තිබූ අතර ස්ථාන මාරු ක්‍රියාත්මක කරන ලෙස නියෝග කර තිබුණි.

2025.10.23 උක්ත නිලධාරිනියගේ අනුප්‍රාප්තිකයා මෙම ආයතනයේ සේවයට වාර්තා කරන ලදි.අනුප්‍රාප්තිකයා වූ උදිතා ප්‍රියදර්ශණී මිය වෙත බී.ජ්.එස්.මධුෂානි මෙය සිදු කරන ලද ආයතනයේ ගිණුම් විෂය රාජකාරි පැවරීමට නියමිතය.2025.12.31 දිනට පිලියෙල කිරීමට නියමිත අවසන් ගිණුම මාස දෙකක් තුල තනිව ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරිනියට කිරීම අපහසු වන බැවින් හා එකී ගිණුම පිලියෙල කිරීම වගකීම් සහගතව නිවැරදිව කිරීමේ අවශ්‍යතාවක් පවතින බැවින් වසර 03ක් පුරා එම කටයුතු ද සිදු කරන ලද උක්ත නිලධාරිනිය මෙම ආවස්ථාවේ මෙම ආයතයේ සේවයෙන් නිදහස් කිරීම ගැටළු සහගත බැව් ගරු සභාවට නේවා දෙමි.

එසේම විටින් විට ඉල්ලීම් කල ද ආයතනයේ මෙතෙක් සම්පූර්ණ නොවූ කලමණාකරන සේවා නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාව 05 කි.එබැවින් කලමණාකරන සේවා නිලධාරි අනුමත කාර්ය මණ්ඩලය වන 12 මෙම නිලධාරිනිය ආයතනය තුල රඳවා ගැනීම මත ඉක්මවායාමක් සිදු නොවන බැවින් බී.ජ්.එස් .මධුෂානි මෙය මෙම ආයතනයේ රඳවා ගැනීම සම්බන්ධ උපදෙස් හා නියෝග සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

- ❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා

බී.ජ්.එස්.මධුෂානි මෙය විසින් රාජකාරි කටයුතු කරන ලද ගිණුම් විෂය, ඉහළ වගකීමක් සහිත විෂයක් වීමත් වර්ෂ අවසන් ගිණුම් සකස් කිරීම කටයුතු පැවතීමත් සහ කලමණාකරන සේවා නිලධාරි පුරප්පාඩු 05 ක් පැවතීම හේතුවෙන් මෙම නිලධාරිනිය ආයතනයෙන් නිදහස් නොකරන ලෙස ප්‍රකාශ කරන ලදි. තව ද ස්ථාන මාරුවීම් ලැබී ඇති අනෙක් නිලධාරිනිය වන ආදායම් පරීක්ෂක නිලධාරිනිය ද ආයතනයේ රඳවා ගැනීම සුදුසු බවටත් යම් ලෙසකින් මෙම

නිලධාරිනියන් දෙදෙනා ආයතනයෙන් නිදහස් කිරීම සිදුවුවහොත් ආයතනය දැඩි අපහසුතාවට පත්වන බවත් ප්‍රකාශ කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

ස්ථාන මාරුවීම් ලැබී ඇති ගිණුම් විෂය නිලධාරිනිය සහ ආදායම් පරීක්ෂක නිලධාරිනි යන දෙදෙනා සභාවේ සුවිශේෂී කාර්යයභාරයක් සිදු කරන බැවින් මෙම නිලධාරින් දෙදෙනාම ආයතනයෙන් නිදහස් නොකිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදි.යම් ලෙසකින් මෙම නිලධාරිනියන් දෙදෙනා ස්ථාන මාරුවීම් ලබා ආයතනයෙන් නිදහස් වුවහොත් ආයතනය දැඩි අපහසුතාවට පත්වන බවත්, මෙම ආයතනයේ සේවය කරන ලද, මේ වන විට සුහද මාරුවීමක් ලබා ආයතනයෙන් නිදහස්ව ඇති ඩී.වී.අජන්තා ප්‍රියසාදනි මහත්මියට ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.

40. <u>රොෂාන් පුෂ්පකුමාර වීරකෝන් යන අය ආදේශක මුරකරු තනතුරේ නැවත සේවයේ පිහිටුවීම සඳහා වූ යෝජනාව</u>

2005.07.16 දින සිට ආදේශක මුරකරු තනතුරේ සේවය කර 2009.03.31 දින සිය සෞඛ්‍ය පරිපාලක තනතුරේ වැඩ ආවරණය කරමින් සිටියදී 2011.02.25 දින සිට වැඩ නවතා ඇති රොෂාන් පුෂ්පකුමාර වීරකෝන් යන අය අප දැනට සේවා අවශ්‍යතාවය මත සේවය ලබාගැනීම යටතේ රාජකාරි වල යොදවා ඇති අතර කාර්යක්ෂමව සේවාව ඉටු කරන බැවින් ආදේශක මුරකරු තනතුරේ නැවත සේවයේ පිහිටුවීමට සුදුසුබව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි. එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා</u>

මොහුගේ සේවා කාලය තුළ ඉතාමත් කාර්යක්ෂමව හා වගකීමෙන් සිය රාජකාරි ඉටුකළ බවත් 2011 වර්ෂයේ දේශපාලන පරිවර්තනයත් සමඟ දේශපාලන පලිගැනීමක් ලෙස කිසිදු හේතු දැක්වීමකින් තොරව මොහුව රාජකාරියෙන් ඉවත් කර ඇති බවත්,මේ වන විට ඝණ අපද්‍රව්‍ය කළමණාකරනය සම්බන්ධයෙන් විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා මොහු විශාල කාර්යයභාරයක් සිදුකරන බවත් ඒ අනුව මොහුව නැවත සේවයේ යෙදවීම සුදුසුබවට ප්‍රකාශ කරන ලදි.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

වර්ෂ 2011 කාලයේ දී ප්‍රාදේශීය සභාවේ පැවතියේ කොමසාරිස් පාලනයනයක් බවත් දේශපාලන පක්ෂයක පාලනයක් නොතිබූ බැවින් මෙහිදී දේශපාලන පලිගැනීමක් සිදු වී නොමැති බවට ප්‍රකාශ කරන ලදි.

- ❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

ප්‍රාදේශීය සභාවේ දේශපාලනය විසින් නොව රට තුළ පැවති දේශපාලනය විසින් සිදු කරන ලද දේශපාලන පළිගැනීමක් බවට ප්‍රකාශ කරන ලදි.



CamScanner

41. **කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙහි සියලුම කසල අංගන හා අට්ටි අංක කරණය හා නාම කරණය කර දැන්වීම් පුවරු ඇද සකස් කිරීමට බී.කේ විමලරත්න මහතාගේ සේවය ලබාගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා වූ යෝජනාව**

කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙහි ඇති සියලුම කසල අංගන හා අට්ටි අංක කරණය හා නාම කරණය කර දැන්වීම් පුවරු මගින් ඇද බෙදා වෙන්කළ යුතුව පවතින බවත් එය සිදුකර ගැනීම සඳහා බී.කේ විමලරත්න මහතාගේ සේවය දින 3ක් සඳහා ලබා ගැනීමට ස්ථානභාර නිළධාරී සුනිල් විතාරණ මහතා විසින් පරිසර කමිටුව වෙත ඉදිරිපත් කරන ලද යෝජනාව සඳහා කමිටු නිර්දේශය හිමි වූ අතර, එම කටයුතු අවසන් කිරීම සඳහා දින 6 ක් ගත වී ඇති බැවින් දිනකට රු. 3500.00 බැගින් දින 6ක් සඳහා රු.21,000.00 ක මුදල බී.කේ විමලරත්න යන අය වෙත ගෙවීම සඳහා වන යෝජනාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

42. **දෙබරවැව විවේකාගාරයට ජලය සැපයීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව පැවරීම සඳහා වූ යෝජනාව**

දෙබරවැව විවේකාගාරයට ජලය සැපයීමේ ව්‍යාපෘතිය සිදු කිරීම සඳහා රබර්වත්ත,තිස්සමහාරාම ලිපිනයේ පදිංචි දෙබරවැව වලදොර පුබුදු ගොවි සංවිධානය වෙත කොන්ත්‍රාත්තුව පැවරීම සුදුසුබවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

43. **කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙහි ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය සිදු කිරීමේ දී එම ගොඩනැල්ලේ අගු සිවිලම සකස් කිරීමද සිදු කිරීම සඳහා වූ යෝජනාව**

කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙහි ගිනිගත් කාර්යාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතිය සිදු කිරීමේ දී එම ගොඩනැල්ලේ අගු සිවිලම සකස් කිරීම ද සිදු කරන ලෙස කොම්පෝස්ට් මධ්‍යස්ථානයෙහි භරකරු විසින් ඉල්ලීම සිදු කර ඇති අතර, අමතර වැඩ සිදු කිරීමක් ලෙස මෙම කාර්යය සිදු කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

44. **ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සඳහා වූ යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඩී.නිපුන ගයාශාන් මහතා 20205.10.24 වන දින පැවැත්වෙන ඔක්තෝම්බර් මස මාසික මහ සභාව වෙත සහභාගී වීමට නොහැකි බවට දැනුම් දී ඇති බවත් ඒ සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම.

➢ **මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම**



CamScanner

2025.10.07 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>කාර්මික සේවා කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.10.07 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.10.02 වන දින පවත්වන ලද පරිසර පොදු පහසුකම් කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.තමිලා දිල්රුක්ෂි මහත්මිය විසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

- <u>නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සභා සම්මත කිරීම</u>

2025.10.07 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් යෝජනා කරන ලදි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.කේ.නිලූකා කුමුදුනි මහත්මියවිසින් ස්ථිර කරන ලදි.
එම යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා,වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.

I. <u>2025 සැප්තැම්බර් මස ඒකාබද්ධ ලැබීම්</u>

2025 සැප්තැම්බර් මස ඉලක්ක ගත මාසික ආදායම රු.22,816,777.21 වන අතර සත්‍ය ආදායම රු.11,788,332.80 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

II. <u>2025 සැප්තැම්බර් මස ඒකාබද්ධ වියදම් සාරාංශය</u>

2025 සැප්තැම්බර් මස ඉලක්ක ගත මාසික වියදම රු.19,226,113.41 වන අතර සත්‍ය වියදම රු.14,611,805.00 ද වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

III. <u>2025 සැප්තැම්බර් මස හිඟ ආදායම් වාර්තාව</u>

2025 සැප්තැම්බර් මාසය අදාළ, ආදායම් අය කර ගැනීම සහ හිඟ ආදායම් පිළිබඳ මාසික ප්‍රකාශය අනුව හිඟ වරිපනම් බදු මුදල රු.2,996,022.97 ක් ද, හිඟ ව්‍යාපාර බදු මුදල රු.409,000.00 ක් ද, හිඟ කසළ බදු මුදල රු.13,000.00 ද, හිඟ යන්ත්‍රෝපකරණ කුලී



CamScanner

රු.311,400.00 ද,හිඟ ටෙන්ඩර් මුදල් රු.217,493.17 ද,හිඟ කඩ බදු රු.4,197,705.80 ද, හිඟ විනෝද බදු රු.295,940.00 ද,හිඟ ගලිබවුසර ගාස්තු රු.12,414.00 වන බවට ගරු සභාපති ,එච්.එල්.ජයසිරි මහතා විසින් සභාගත කරන ලදි.

IV. <u>2025 සැප්තැම්බර් 01 දින සිට සැප්තැම්බර් 30 දක්වා රු.100,000.00 ඉක්ම වූ ගෙවීම් විස්තරය ඇතුළත් වාර්තාව</u>

| දිනය | වවුචර් අංකය | වවුචර් විස්තරය | ගෙවන ලද ආයතනය/කාටද? | මුදල රු.00 |
|---|---|---|---|---|
| 2025.09.04 | 7 | 1556 මහ ට්‍රැක්ටරයේ එංජිම සම්පූර්ණ අළුත්වැඩියා කිරිම සහ ක්ලච් ප්ලේට් සපයා සවිකිරිම. | රුවන් වර්ණකුමාර සේනානායක | 288,750.00 |
| 2025.09.09 | 8 | 2025 අගෝස්තු මස කාර්ය මණ්ඩල ආදේශක/අනියම් වැටුප් ගෙවීම. | ලේකම් - තිප්‍රාස. සභා කාර්ය මණ්ඩලය | 243,158.26 |
| 2025.09.10 | 16 | 2025 අගෝස්තු මස කාර්ය මණ්ඩල අතිකාල දීමනා ගෙවීම. | ලේකම් - තිප්‍රාස. සභා කාර්ය මණ්ඩලය | 470,797.00 |
| | 18 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව කසළ කටයුතු සඳහා සේවය ලබාගත් දෛනික කාර්ය මණ්ඩලය සඳහා කුලී පදනම මත වැටුප් ගෙවීම. - 2025 අගෝස්තු | ලේකම් - තිප්‍රාස. සභා දෛනික කාර්ය මණ්ඩලය | 712,800.00 |
| 2025-08-07 | 21 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරිම. | ඉරේෂා පිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 461,712.50 |
| | 22 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් සිලින්ඩර් 09 ක් මිළට ගැනීම | සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම | 160,316.97 |
| | 23 | නව ආයුර්වෙද ගොඩනැඟිල්ලේ අභ්‍යන්තර කාමර වෙන් කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ගෙවීම. | එම්.එස්. තිස්ස උදාර ගොවි සංවිධානය | 1,160,222.61 |
| 2025.09.11 | 27-1 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපල සේවය කිරිම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | එස්.පී.කේ. හර්ෂණ | 114,775.00 |
| | 27-11 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ යාන්ත්‍රික වැඩපල සේවය කිරිම වෙනුවෙන් ගාස්තු ගෙවීම. | පී. හර්ෂණ | 114,775.00 |
| 2025-09-18 | 47 | තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු ආයතන වල ජල බිල්පත් පියවීම. | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 157,766.00 |
| | 63 | තොග ඉන්ධන බවුසරය සඳහා අවශ්‍ය මීටරය හා මෝටරය හැඩලය සහ බටය මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරිම. | ප්‍රියන්ත එන්ටර්ප්‍රයිසස් | 311,475.00 |
| 2025-09-19 | 66 | 2025 සැප්තැම්බර් මස සභික දීමනා ගෙවීම. | ප්‍රාදේශීය සභා සභික මණ්ඩලය | 345,000.00 |
| 2025.09.23 | 78 | 2025 සැප්තැම්බර් මස ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම. | ලේකම් - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය | 6,023,205.55 |



CS CamScanner

| | | | | |
|---|---|---|---|---|
| | 81 | සභාව සතු රථවාහන සඳහා ඉන්ධන මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | ඉරේෂා ෆිලිං ස්ටේෂන් පුද්ගලික සමාගම | 382,712.00 |
| | 87 | මහ ට්‍රැක්ටර් ට්‍රේලර් 02 සකස් කිරීමට අවශ්‍ය උපාංග මිළට ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | සුරංග හාඩ්වෙයාර් ප්‍රයිවට් ලිමිටඩ් | 518,275.00 |
| 2025.09.29 | 112 | මහසෙන්පුර ආදාහනාගාරය සඳහා 37.5 kg ගෑස් සිලින්ඩර් 09 ක් මිළට ගැනීම | සෝමසිරි ස්ටෝර්ස් පුද්ගලික සමාගම | 124,690.98 |
| | 113 | සභාවේ නිළඇඳුම් හිමි නිලධාරී සේවක මණ්ඩලය සඳහා නිලඇඳුම් දීමනාව ලබාදීම. | බී.ආර්. රේණුකා | 234,600.00 |

## V. 2025 සැප්තැම්බර් 01 සිට 2025 සැප්තැම්බර් 30 දින දක්වා සැලසුම් කමිටු අනුමැතිය ලැබී ඇති ගොනු ඇතුළත් වාර්තාව

| අනු අංකය | ලියාපදිංචි අංකය | නම හා ලිපිනය | අනුමැතිය | කමිටු දිනය |
|---|---|---|---|---|
| 01 | ත්‍රිප්‍රාස/19/SD/2025/147 | මාදුගොඩගේ දොන් සරත්, අංක 202, කිරින්ද පාර, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය. | 2025.09.09 |
| 02 | TPS/19/SD/2025/154 | බී.ජී.ගුණතිලක , 80/13, ඇලපාර, කව්වෙරියගම, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 03 | TPS/19/SD/2025/155 | යූ.එන්.රිස්නා ,අංක 281,කිරින්ද පාර,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 04 | TPS/19/SD/2025/156 | කේ.ඒ.පී.පුෂ්පා දමයන්ති, වරාකනත්ත,කව්වෙරියගම, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 05 | TPS/19/SD/2025/157 | ඩබ්.ඒ.කුසුමලතා ,අංක 255/6A,කෙසෙල්වත්ත,හැළඹගස්වල , තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 06 | TPS/19/ SD /2025/158 | ඩබ්.ඒ.දිලූෂිකා මයුරංගි,අජක 24/6,ගුණවර්ධන මාවත,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 07 | TPS/19/ SD /2025/160 | තිස්ස ඉන් ප්‍රයිවට් ලිමිටඩ්,අංක 212/B,වැල්ලවාය පාර, පොල්ගහවැලැන, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 08 | TPS/19/ SD /2025/161 | තිස්ස ඉන් ප්‍රයිවට් ලිමිටඩ්,අංක 212/B,වැල්ලවාය පාර, පොල්ගහවැලැන, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 09 | TPS/19/SD/2025/162 | තිස්ස ඉන් ප්‍රයිවට් ලිමිටඩ්,අංක 212/B,වැල්ලවාය පාර, පොල්ගහවැලැන, දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 10 | TPS/19/SD/2025/163 | තිස්ස ඉන් ප්‍රයිවට් ලිමිටඩ්,අංක 212/B,වැල්ලවාය පාර, පොල්ගහවැලැන, | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |



CamScanner

| | | | | |
|---|---|---|---|---|
| | | දෙබරවැව, තිස්සමහාරාම | | |
| 11 | TPS/19/SD/2025/164 | ජේ.කේ.බෙන්ඩික්,අංන 934/2,දෙබරවැව,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 12 | TPS/19/SD/2025/165 | එස්.පී.ශෙහාන් නිමසර, මෝලකැපුපතාන,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 13 | TPS/19/SD/2025/04 | ඩබ්.ජී.දයාරත්න,පොල්ගහවැලැන,දෙබර වැව ,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 14 | TPS/19/SD/2025/96 | ඩබ්.ජී.දයාරත්න,පොල්ගහවැලැන,දෙබර වැව ,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.09 |
| 15 | TPS/19/SD/2025/148 | ශාන්තප්‍රිය අන්ද්‍රා හැන්නදි, මැදැවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 16 | TPS/19/SD/2025/149 | සේනක ප්‍රියන්ත අන්ද්‍රා හැන්නදි, මැදැවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 17 | TPS/19/SD/2025/150 | සේනක ප්‍රියන්ත අන්ද්‍රා හැන්නදි, මැදැවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 18 | TPS/19/SD/2025/151 | සේනක ප්‍රියන්ත අන්ද්‍රා හැන්නදි, මැදැවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 19 | TPS/19/SD/2025/166 | එච්.එම්.වර්ණසූරිය,අලුත්ගොඩපාර,දෙබර වැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 20 | TPS/19/SD/2025/152 | නෝවා ප්‍රයිවට් ලිමිටඩ,වීරවිල හන්දිය,වීරවිල | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 21 | TPS/19/SD/2025/168 | ජී.ඩබ්.සිරිපාල,අංක 411, මෝලකැපුපතාන,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 22 | TPS/19/SD/2025/159 | චින්තක වන්න අබේවර්ධන, යාල පාර,කිරින්ද ,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 23 | TPS/19/ SD /2025/167 | එච්.ආර්.එස්.කුමාර,අංක 152,41/2,යෝධකණ්ඩිය ,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 24 | TPS/19/ SD /2025/169 | ඩබ්.ආර්.නිශ්ශංක ,අංක 69,පළමු පටුමඟ,මදච්ච,අංජලිගල, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 25 | TPS/19/ SD /2025/81 | යූ.එන්.අයි.එස්.උණගල්ල,වැවේයාය, යෝධකණ්ඩිය, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 26 | TPS/19/ SD /2025/172 | ඩී.පී.එස්.අබේරත්න,භාග්‍යා හාල්මෝල,රන්දුනු වත්ත,වීරවිල | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 27 | TPS/19/ SD /2025/170 | ඩබ්.ආර්.නිශ්ශංක ,අංක 69,පළමු පටුමඟ,මදච්ච,අංජලිගල, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.26 |
| 28 | TPS/19/ SD /2025/175 | පී.එච්.ගාමිණී ගුණසිංහ,ගුණවර්ධන මාවත,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.09.29 |

| | | | | |
|---|---|---|---|---|
| 29 | TPS/19/ SD /2025/176 | පී.එච්.ගාමිණී ගුණසිංහ,ගුණවර්ධන මාවත,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 30 | TPS/19/ SD /2025/179 | ඩී.කේ.නිලූකා දිල්හානි,දියකැදිය පාර,පන්නේගමුව,වීරවිල | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 31 | TPS/19/ SD /2025/180 | එච්.ආර්.කේ.විමල් කාලුම් කුමාර,කොච්චිපතාන,කතරගම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 32 | TPS/19/ SD /2025/177 | ඩබ්.ආර්.අමිත්,තුරෝෂන්,අංක 838, මැදවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 33 | TPS/19/ SD /2025/178 | ඩබ්.ආර්.අමිත්,තුරෝෂන්,අංක 838, මැදවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 34 | TPS/19/ SD /2025/181 | සිරිපාල වික්‍රමසිංහ , කොච්චිපතාන,කතරගම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 35 | TPS/19/ SD /2025/153 | එම්.කේ.එස්.සී.සම්පත් ,ගුණවර්ධන මාවත,දෙබරවැව,තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 36 | TPS/19/ SD /2025/183 | ජී.පූ.ගජසිංහ, අහෝදාව, හල්මිල්ලාව, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 37 | TPS/19/ SD /2025/171 | කේ.ඩබ්.පුෂ්පා,අංක 733,කු.ග.07,වීරහෙළ, තිස්සමහාරාම | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 38 | TPS/19/ SD /2025/117 | ඩබ්.පී.රොෂාන් ජනරංජන, ඩී.ඩී.ගුණවර්ධන | අනුබෙදුම් අනුමත විය | 2025.09.29 |
| 39 | TPS/19/ BA/2025/35 | කී.පී.ඉසුරු ප්‍රියංක,අංක 856, මැදවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.09.09 |
| 40 | TPS/19/ BA/2025/47 | කී.පී.ඉසුරු ප්‍රියංක,අංක 856, මැදවැලැන,දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.09.09 |
| 41 | TPS/19/ BA/2025/65 | මාදුගොඩගේ දොන් සරත්, අංක 202, කිරින්ද පාර, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.09.09 |
| 42 | TPS/19/ BA/2025/61 | ඩබ්තප්.රවිඳු ලක්මාල්,අංක 434/4ඒ,මෝලහැඳුපතාන,තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.09.09 |
| 43 | TPS/19/ BA/2025/66 | වත්තේගේ ගුණදාස,මුතුමාල වත්ත,කිරින්ද පාර, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.09.09 |
| 44 | තිප්‍රා/සං/අ/2024/79 | එම්.ජී.ශ්‍රීනාල් විකසිත,ප්‍රධාන වීදිය, කච්චේරියගම, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම් අනුමත විය | 2025.09.09 |



CamScanner

| | | | | |
|---|---|---|---|---|
| 45 | TPS/19/ BA/2025/67 | ඩී.පී.ජ්.සෝමාවති,ගල්කණු අක්කරය, ගැමුණුපුර,දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.09.26 |
| 46 | TPS/19/ BA/2025/70 | දුෂාන්ත මනෝජ්, අංක 669/2, පුදුවැලිපැලැස්ස,කිරින්ද , තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.09.26 |
| 47 | TPS/19/ BA/2025/71 | එච්.ආර්.එස්.කුමාර,අංක 152,41/2,යෝධකණ්ඩිය, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.09.29 |
| 48 | TPS/19/ BA/2025/73 | ජේ.එම්.ඩබ්.එස්.සඳරුවන්,ආතර් පෙදෙස, ඩී.ඩී.ගුණවර්ධන මාවත, දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.09.29 |
| 49 | TPS/19/ BA/2025/59 | ඩබ්.පීරොෂාන් ජනරංජන, ඩී.ඩී.ගුණවර්ධන මාවත, දෙබරවැව, තිස්සමහාරාම | ගොඩනැගිලි සැලසුම අනුමත විය | 2025.09.29 |
| 50 | තිප්‍රාස/19/සං/අ/2024/64 | එච්.පී.ජී.නිශාන්ත ලාල් දේශප්‍රිය, අංක 660,රෝහණපුර,තිස්සමහාරාම | වසර 01 ක කාලය දීර්ඝ කිරීම අනුමත විය | 2025.09.29 |
| 2025.08.01 සිට 2025.08.31 දින දක්වා | | | | |
| 51 | TPS/19/ SD /2025/67 | යූ.ජේ.එස්.මෙලන් ලංකා, සඳගිරිපුර,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.26 |
| 52 | TPS/19/ SD /2025/68 | යූ.ජේ.එස්.මෙලන් ලංකා, සඳගිරිපුර,තිස්සමහාරාම | අනුබෙදුම අනුමත විය | 2025.08.26 |

(ඖ) වෙනත් කරුණු.

❖ අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.තනුජා දිලානි මහත්මිය

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන බවත් , විරහෙල පන්සල පවිත්‍ර කරගැනීම සඳහා JCB යන්ත්‍රය ඉල්ලා සිටි බවත් ඒ සඳහා JCB යන්ත්‍රය කඩිනමින් ලබාදීමට කටයුතු සලසාදෙන ලෙසත් ,පළමු සභායෝජනාව ලෙස ලබාදුන් අබලන් වූ ලැලි පාලම පිළිසකර කිරීම මේ දක්වා සිදුකර නොමැති බවත් එය කඩිනමින් සිදුකර දෙන ලෙසත් මේ සම්බන්ධයෙන් එම ස්ථානයට ගොස් සොයා බලා වාර්තා කරන ලද මාධ්‍යවේදී රුක්මන් මහතාට ස්තුතිවන්ත වන බවත්, පාරවල් දෙකක් සෑදීම සඳහා ගල්වැලි ලබාදෙන බවට ඔබතුමන්ලා විසින් ප්‍රකාශ කර ඇති බැවින් ඒ පිළිබඳව මාගෙන් විමසීම් කරන ලෙස ජනතාව දැනුවත් කර තිබීම නිසා ඒ පිළිබඳව ජනතාව මාගෙන් විමසීම කරන බැවින් මා අපහසුතාවට පත්වී ඇති බවත් ඒ සම්බන්ධව අදාළ ප්‍රජා සංවිධාන සහ ග්‍රාමීය සංවිධාන සමාජිකයින් නිවරදිව දැනුවත් කර ජනතාවගේ තිබෙන වැරදි මත දුරුකිරීමට කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කර ලදි.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා

JCB යන්ත්‍රය පවතින තත්වය සම්බන්ධයෙන් අවබෝධයෙන් යුතුව ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසත් JCB යන්ත්‍රය එක් දිනක් කාර්යයන් සඳහා යෙදවුවහොත් ඊළඟ දවසේ ගරාජ් එකකට දැමීමට සිදුවන බවත්, නිසි පරිදි භාවිත නොකිරීම නිසා මෙම තත්වය මතුවී ඇති බවත්,මේ වන විට කසළ කළමණාකරණය සම්බන්ධයෙන් විශාල ව්‍යාපෘති ප්‍රමාණයක් සහ සංවර්ධන

ව්‍යාපෘති ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා තාක්ෂණසේවා නිලධාරීන් මෙ දින වල ඉතාමත් කාර්යය බහුලවී ඇති බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ටී.චමින්ද ජයනාත් මහතා</u>

ජනතාව අතර අපගේ නම් භාවිතා කරමින් යම් යම් දේශපාලන මතභේද ඇති කර දේශපාලන වාසි ලබාගැනීමට කටයුතු කරන පිරිස් සිටිය හැකිමුත් එකී මතභේද සභාවේ කාර්යයන් සඳහා අදාළ කර නොගෙන, සභාව ආරම්භයේදී පැවති සියළුම දෙනාගේ සහෝදරත්වය එකමුවබව ඉදිරියට පවත්වාගෙන යාමට සියළුදෙනාගේ සහයෝගය ලබාදෙන ලෙසත්, යම් අඩුපාඩුවක් පවතිනම් එය පෙන්වාදී සභාවක් ලෙස පොදුවේ නිවරදි කරගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් , වාහන අංගනයේ භාවිතයෙන් ඉවත් කර තිබූ වාහන දකිනට විට කණගාටුවක් ඇතිවන බවත් , සභාවේ පවතින යම් යම් වාහන යන්ත්‍රසූත්‍ර නිසි තත්වයේ නොමැති බැවින් නව වාහන ලබා ගැනීමට අදාල කටයුතු මෙ වන විට සිදු කරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.කේ.එම්.රෝහිත මහතා</u>

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඝාතනය හෙළා දකින බවත් , යම් ඝාතනයක් සිදු වූ විය එය පාතාලයට භාරදී සිටීම රජයේ වගකීම නොවන බවත්,අප පාලන කාලයේ දී මෙවැනි මිනිස් ඝාතනයක් සිදුවුවහොත් ඒ සම්බන්ධව සොයා බලා සභාවෙන් ඉටුවිය යුතු කාර්යයභාරය ඉටු කරන ලෙසට එවකට සභාව නියෝජනය කළ ජාතික ජනබලවේගයේ මන්ත්‍රීවරුන් විසින් හඩ නැගුබවත් එම ඝාතනය සම්බන්ධයෙන් සභාවක් ලෙස සිදු කළ හැකි යම් යුතුකමක් පවතිනම් එය සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.අප පාලනය භාරගන්නා අවස්ථාවේ දීත් වාහන අංගනයේ මෙවැනි තත්වයක් තිබූ බවත් නැවත භාවිතයට ගත හැකි වාහන පමණක් සකස්කළ බවත් ප්‍රකාශ කරන ලදි. ඔබතුමන්ලා සභාව භාරගන්නා ලද්දේ වසර දෙකක කොමසාරිස් පාලනයකින් පසුව බවත් අප පාලනය භාරගත්තේ වසර පහක කොමසාරිස් පාලනයකින් පසුව බවත්,අප පාලනයට පැමිණීමෙන් පසුව කිසිවෙකුට දෝෂාරෝපණය නොකර යම් දේ නිවරදි කරගනිමින් ජනතාවට සේවය සැපයූබවත්, අප විසින් එම වාහන ඉතාමත් අඩු මිල ගණන් යටතේ සකස්කළ බවත් අප පාලන කාලයේ කම්පැක්ටර් දෙකක් ලබාගත් බවත් එම කාලයේ දී අප විසින් ජනතාව වෙනුවෙන් කල සේවාව ජනතාව දන්නා බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඩබ්ලිව්.සිරිසේන මහතා</u>

වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධයෙන් පොලිස් වාර්තා අනුව ජනමාධ්‍ය තුළින් පළවන අදහස් වන්නේ එතුමා පාතාලයට සම්බවන්ධ පුද්ගලයෙක් බවත් එමෙන්ම ඔබතුමන්ලාගේ පාලන කාලයේ දී තාඩුඩීන්, ලසන්ත වික්‍රමතුංග,ප්‍රදීප් එක්නැලිගොඩ ,එම්.කේ.රංජිත් ඝාතනය සහ සිය ආගම ඇදහිමට සඳහා ගිය පිරිස ඝාතනය සිදු වූ බවත් ඒ සඳහා සභා තීරණ ලබාගැනීමක් සිදුවුනිද යන්නත් විමසීම් කළ අතර පාතාලය සහ මත්ද්‍රව්‍ය වලින් තොරවූ ජීවත්වීමට සුදුසු රටක් බිහිකිරීම අපගේ අරමුණු වන බවත් ප්‍රකාශ කරන ලදි. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ පවතින පාරවල් තාර පාරවල් බවට පත් කිරීමෙ අරමුණින් ගල්කෂරයක් ස්ථාපිත කළ අතර එයද මෙ වන විට විනාශයට පත්ව ඇති බවත් , 2002 වර්ෂයේ සභාවේ පාලනය භාරගත් පසුව මෝටර් ග්‍රේටර්,බැකෝ ලෝඩර් සහ ටිපර් වැනි විශාල වත්කම් ප්‍රමාණයක් සභාවට එකතු කර විශාල වැඩ කොටසක් සිදුකරමින් සිටියදී අපගේ පාලනය ගිලිහි ගිය බවත් මේවැනි දේ සම්බන්ධයෙන් වාදවිවාද සිදුකිරීම ඵලදායි කටයුත්තක් නොවන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.දයාසේන මහතා</u>

ජලය බෙදාහැරීමෙ වගකීම තමන් සතු වගකීම වන බවත් වාහන කැඩී පවතින ඇතැම් අවස්ථාවල දී තමන් ද අපහසුතාවට පත්ව ඇති බවත් එවැනි විටක කිසිවෙකුට චෝදනා



CamScanner

නොකර සභාවක් ලෙස සියළුම මන්ත්‍රීවරුන් එකතු වී ඉදිරි කටයුතු කිරීමට සියළුදෙනාගේ සහයෝගය ලබාදෙන ලෙස ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එල්.වීරේන්ද්‍ර විරාජ් මහතා</u>

පසුගිය කාලයේ දේශපාලන තිබූ අඩුපාඩු විවේචනය කරමින් තර්ක විතර්ක සිදු කිරීම ඵලදායී නොවන බවත් සභාවේ ඉදිරි කටයුතු කරගෙන යාම සඳහා සියළුමදෙනා එකතු වී කටයුතු කළයුතු බවට ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.තමිලා දිල්රුක්ෂි මහත්මිය</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද සාහිත්‍ය මාසය සාර්ථකව සිදු කිරීම සඳහා සහය ලබාදුන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළුම දෙනාටත් , ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ටත් ස්තුතිය පුද කරන බව ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති ආර්.රජිත් ප්‍රියදර්ශන මහතා</u>

පාතාලය සහ නීතිය සම්බන්ධයෙන් යම් අදහසක් දැක්විය යුතු බවත් ඒ අනුව එවකට පතාලය සඳහා දේශපාලයේ රැකවරණය ලැබූ බැවින් එවකට එය ගැටළුවක් බවට පත්වූ බවත් මේ වන විට පාතාලය සඳහා දේශපාලන රැකවරණය නොලැබෙන බවත් ප්‍රකාශ කරන ලදි.මේ වනවිට නීතියේ ස්වාධීනත්වය පවතින බැවින් නිසි තීන්දු තීරණ ලබාගනිමින් නීතිය ක්‍රියාත්මක වන බවත් ඒ අනුව ඉදිරියේ දී පාතාලය සහ මත්ද්‍රව්‍ය යන උවදුරු දෙකම මෙරටින් තුරන් කිරීමට කටයුතු සිදුකරමින් පවතින බවට ප්‍රකාශ කරන ලදි. ඉදිරියේ දී විශාල සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාණයක් සිදු කිරීමට නියමිතව ඇති බවත් සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා සියළුමදෙනාගේ සුහදත්වය සහ සහයෝගීතාව අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.සුනිල් පියංකර මහතා</u>

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන ලද සාහිත්‍ය මාසය මූලිකත්වය ගෙන කටයුතු කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.තමිලා දිල්රුක්ෂි මහත්මියට ස්තුතිවන්ත වන බවත්, වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධයෙන් ශෝකය ප්‍රකාශයට පත්කළේ එතුමාගේ චරිතයට නොවන බවත් දේශපාලන මන්ත්‍රීවරයකු වන නිසා බවත් ප්‍රකාශ කරන ලදි.පසුගිය දේශපාලන තත්වයන් සම්බන්ධයෙන් නිතරම චෝදනා කරමින් අදහස් දැක්වීම ඵලදායි නොවන දෙයක් වන බවත් කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ සිදු කරනු ලබන කාර්යය ඉතාමත් යහපත් දෙයක්බවත් ප්‍රකාශ කරන ලදි. පෙර අවස්ථාවක දී ගොවියා දෙවියා මාවත සංවර්ධනය කර තිබුණ ද එය නිසි පරිදි සිදුකර නොමැති බවත් මෙවර ඒ ආකාරයෙන් නොවන ලෙස සංවර්ධනය කටයුතු සිදු කරන ලෙසත් විලමුල්ල පුස්තෝලමුල්ල මාර්ගය මේවන විට ප්‍රතිසංස්කරණ සිදු කර ඇති බැවින් ඒ සඳහා ස්තුතිවන්ත වන බවත් විලමුල්ල සුසාන භූමිය පවිත්‍රකර දෙනලෙස ඉල්ලීමක් සිදුකර ඇති බවත් එය කඩිනමින් ඉටුකරදීම කටයුතු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති එච්.එල්.ජයසිරි මහතා</u>

සියළුදෙනාටම පක්ෂ විපක්ෂ විවිධ මත පැවතිය හැකි නමුත් ඒ මතභේද හේතුවෙන් භේදයන් ඇති කර නොගෙන පක්ෂ විපක්ෂ භේදයකින් තොරව කටයුතු කිරීම සිදු කළ යුතු බවත් අදහස් ප්‍රකාශ කිරීමේ දී අවබෝධයකින් යුතුව අදහස් දැක්වීම සිදු කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.කසළ කිච්චම ඇතිවන අප්‍රියජනක හැගීම උද්ධගන්දර කසළ ප්‍රතිචක්‍රීකරන මධ්‍යස්ථානයේ වැඩපිළිවෙළත් සමඟ වෙනස් කිරීම අපගේ බලාපොරොත්තුව වන බවත් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මෙම ආකෘතිය මගින් රටටම ආදර්ශයක් ලබා දීම අපගේ

ප්‍රධාන අරමුණු වන බැවින් එම සඳහා සියළුමදෙනාම සහෝදරත්වයෙන් එකමුතු වී කටයුතු කිරීම අපේක්ෂා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ලේකම්තුමියටත්, මාධ්‍යවේදී රුක්මන් රත්නායක මහතාටත් ගරු සභාපති, එච්.එල්.ජයසිරි මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව.01.00 ට පමණ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ආර්.එම්.චතුරානි වැලිවිහාරේ,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

එච්.එල්.ජයසිරි,
සභාපති,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති
ප්‍රාදේශීය සභාව
තිස්සමහාරාම

2025 ඔක්තෝම්බර් මස 24 වන දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.



CamScanner